**ඔපෙක් අරමුදලින් මූල්‍යයනය කරන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - 2020**

---

ඔපෙක් අරමුදලින් මූල්‍යයනය කරන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ පෙර තෝරාගත් ජාතික මාර්ගවල කිලෝමීටර් 27 ක් වැඩිදියුණු කිරීම, සංවර්ධනය කිරීම හා පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,232.5කට සමාන එ.ජ.ඩො. මිලියන 24.87ක් වන අතර ඉන් රු.මිලියන 2,209.84කට සමාන එ.ජ.ඩො. මිලියන 17ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල විසින් ලබාදීමට එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි ඉදිකිරීම් කටයුතු 2017 ඔක්තෝබර් 05 දින ආරම්භ කරන ලද අතර 2019 ජූනි 28 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කටයුතු 2021 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

---

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, 2020 වර්ෂය අවසාන දිනට ණය ගිණුම රු.මිලියන 437 විය. නමුත්, ව්‍යාපෘතිය එය රු. මිලියන 273ක් ලෙස දක්වා තිබුණි. එම නිසා ණය ගිණුමේ ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | 164 | රු.163,659,874.71ක ඉතිරි මුදල 2020 වර්ෂය සඳහා වියපැහැදම් කළ හැකි විදේශ ආධාර ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් කාලපරිච්ඡේදය අවසාන දිනට නිවැරදි ණය ශේෂය දැක්වීමට සත්‍ය වියපැහැදම් වාර්තා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් පැකේජ - 1හි වැඩ විෂය පථයෙන් වල්ගම - අතුරුගිරිය මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු ඉවත් කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල වැඩියෙන් ගෙවා තිබුණි. | 13 | එකඟ වේ.<br>මාර්ග දෙකෙහිම BOQ ඇතුළත් ප්‍රමාණ පත්වල සාරාංශය පදනම් කර ගනිමින් අත්තිකාරම් ගෙවීම නොසැලකිලිමත්ව ගණනය කර ඇත | ව්‍යාපෘතිය ආරම්භයේදී ව්‍යාපෘතියේ වැඩ විෂය පථය නිවැරදිව හඳුනා ගත යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් පැකේජ - 1හි 2020 නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා අන්තර් ගෙවීම් සහතිකපත් 2 කට අදාළ වෙන් කිරීම් 2020 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | 1.78 | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසු බිලපත් ලැබීම නිසා දෙසැම්බර් මස බිල්පත සඳහා පමණක් රු. මිලියන 5ක වෙන් කිරීමක් සිදු කර තිබුණි. ඉතිරි මුදල 2021 වර්ෂයේ ගිණුම්ගත කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව වෙන් කිරීම් සිදු කළ යුතුය. |
| (ඈ) | 17 වන වගන්තිය යටතේ ඉඩම් හිමියන්ට ගෙවිය යුතු වන්දි රු.මිලියන 0.89ක මුදල ප්‍රමාදවීම් මත ගෙවිය යුතු පොළිය 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | 0.28 | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසු බිලපත් ලැබීම නිසා දෙසැම්බර් මස බිල්පත සඳහා පමණක් රු. මිලියන 5ක වෙන් කිරීමක් සිදු කර තිබුණි. ඉතිරි මුදල 2021 වර්ෂයේ ගිණුම්ගත කර ඇත. | ව්‍යාපෘතියේ සියලු වගකීම් නිවැරදිව වාර්තා කළ යුතුය. |

**3.** භෞතික කාර්ය සාධනය

**3.1** ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| සංරචකය | **2020** දෙසැම්බර් **31** දිනට අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ප්‍රතිශතය | අත්කර ගත් කාර්ය සාධනය ප්‍රතිශතය **%** | විගණන ගැටලුව | ප්‍රමාදයන් සඳහා හේතු |
|---|---|---|---|---|
| කොන්ත්‍රාත් පැකේජ - 1 කඩුවෙල - අතුරුගිරිය මාර්ගය | 78% | 52% | මාර්ගයේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය අපේක්ෂිත ඉලක්කවලට පසුපසින් පැවතුණි. මෙය ව්‍යාපෘතියේ ප්‍රමාදයට සහ ව්‍යාපෘතියේ පිරිවැය ඉහළයාමට හේතුවේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලු සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය ව්‍යාපෘතියේ ප්‍රමාදයට හේතු වී ඇත. |
| කොන්ත්‍රාත් පැකේජ - වාද්දුව - මොරොන්තුඩුව මාර්ගය බෙල්ලන - මොරගල මාර්ගය | 100% | 100% | | |

කළමනාකරණයේ ප්‍රතිචාර එකඟ වේ.

විගණකගේ නිර්දේශ ඉලක්කගත දිනයන්ට කටයුතු නිම කිරීමට ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය.

**3.2** ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදයන්

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණනකගේ නිර්දේශ |
|---|---|---|
| 2015 ජුනි 26 දින ණය ගිවිසුම අත්සන් කර තිබුණද, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා කාලය ගතවීම හේතුවෙන් කොන්ත්‍රාත් පැකේජ - 1 යටතේ මාර්ග 02 පුනරුත්ථාපන කටයුතු අවුරුදු 2½ කට පසුව 2018 ජනවාරි 29 දින ආරම්භ කර තිබුණු අතර, කොන්ත්‍රාත් පැකේජ II යටතේ අනෙකුත් මාර්ග 02හි පුනරුත්ථාපන කටයුතු අවුරුදු 02 මාස 03ක ප්‍රමාදයන් සහිතව 2017 ඔක්තෝබර් 05 දින ආරම්භ කර තිබුණි. කෙසේවෙතත්, අරමුදල් නොමැතිවීම හේතුවෙන් කොන්ත්‍රාත් පැකේජ - 1 යටතේ වල්ගම - අතුරුගිරිය මාර්ගයේ කිලෝමීටර් 1.25ක පුනරුත්ථාපන කටයුතු ව්‍යාපෘතියේ වැඩ විෂය පථයෙන් පසුව ඉවත් කර තිබුණි. | එකඟ වේ. ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය සාධනීය මට්ටමකට පැමිණෙන තෙක් ව්‍යාපෘතිය ආරම්භ කිරීම කල් දමා තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ දුර්වල ප්‍රගතිය සහ සිවිල් කොන්ත්‍රාත් සඳහා ණය ප්‍රතිපාදන හිඟකම හේතුවෙන් වල්ගම - අතුරුගිරිය මාර්ග කොටස ඉවත් කර තිබුණි. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පෙර ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිම කිරීම අවශ්‍ය වන අතර, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් පසු ණය ගිවිසුම ආරම්භ කර බලාත්මක විය යුතුය. |

**3.3** ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| ලැබී තිබූ තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් මාර්ග ඉදිකිරීමේ අරමුණින් කඩුවෙල, පාලින්ද නුවර, අඟලවත්ත, වලල්ලාවිට පානදුර සහ කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පවතින රජයේ ඉඩම් කොටස් 489ක් ඇතුලුව ඉඩම් කොටස් 2,687ක් අත්පත් කරගෙන තිබුණු අතර, 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොටස් 1,716ක් සඳහා වන්දි ගෙවීම් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් නිසා රු. මිලියන 286ක පොළිය ඇතුලුව රු. මිලියන 1,600ක වන්දි මුදලක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ ඉඩම් කොටස් 22 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. | අත්පත් කර ගත යුතු ඉඩම් ප්‍රමාණය හැර සපයන ලද විස්තර නිවැරදි වේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු හා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |